මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| බුද්ධ ධර්මය I/II | 7 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................

## I පත්‍රය

- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මුලු ලකුණු සංඛ්‍යාව 40 කි.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ප්‍රථම ද්වෙවාචික උපාසකවරු කවරහු ද?
   - i. ආලාර කාලාම, උද්දකරාම පුත්ත ය.
   - ii. තපස්සු, භල්ලුක වෙළඳ දෙබෑයන් ය.
   - iii. සැරියුත්, මුගලන් හිමිවරු ය.
   - iv. ගිහි පැවිදි දෙපිරිස ය.

2) ගිලානෝපස්ථානය උතුම් කාරණයක් බව බුදුරජාණන් වහන්සේ ක්‍රියාවෙන් පෙන්වා දුන්සේක. බුදුරජාණන් වහන්සේ උපස්ථාන කළ ගිලන් භික්ෂුවකි.
   - i. සැරියුත් හිමි
   - ii. මුගලන් හිමි
   - iii. පූතිගත්ත තිස්ස හිමි
   - iv. සෝපාක හිමි

3) බුදු ගුණ පාඨයෙහි ඇතුළත් බුදුගුණ ගණන වනුයේ,
   - i. 6 කි
   - ii. 9 කි
   - iii. 12කි
   - iv. 15 කි

4) **"ඇඳුමට වැඩි වියදම් නොකරන් නේ..."** මෙම පද්‍යය ඇතුළත් කෘතිය වන්නේ,
   - i. සිරිත්මල්දම ය
   - ii. කාව්‍යශේඛර ය
   - iii. ලෝවැඩසඟරාව ය
   - iv. බුදුගුණ අලංකාරය ය

5) මෛත්‍රිය වැඩීම ගැන සඳහන් සූත්‍රය කි.
   - i. පරාභව සූත්‍රය
   - ii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
   - iii. කරණීයමෙත්ත සූත්‍රය
   - iv. වසළ සූත්‍රය

6) බුදුසසුනේ අග්‍ර දායකත්වයට පත්වූයේ,
   - i. අනේපිඬු සිටුතුමා ය.
   - ii. ආනන්ද තෙරුන් ය.
   - iii. අස්සජීතෙරුන් ය.
   - iv. අජාසත්ත රජතුමා ය.



LIVEWORKSHEETS

7) බෝසතාණන් වහන්සේට බුද්ධත්වයට පත්වීමට පෙර කිරිපිඬු පූජා කළේ,

ii. යසෝධරා දේවිය යි

ii. විශාඛා සිටු දියණිය යි.

ii. සුජාතා සිට දියණිය යි.

ii. මහා ප්‍රජාපතී ගෝතමිය යි.

8) බෞද්ධයාගේ නිත්‍ය ශීලය වන්නේ,

i. අටසිල් ය.

iii. ආජීව අෂ්ටමක සීලයයි.

ii. දසසිල් ය.

iv. පන්සිල් ය.

9) මිනිසා හා සතුන් අතර වෙනස්කම් දක්නට ලැබේ. වෙනස්කම් අතර මිනිසා සතුන්ගෙන් වෙනස් වන්නේ,

i. සදාචාර සම්පන්න බව නිසාය.

iii. අධ්‍යාපනයට යොමු නොවීම නිසා ය.

ii. සදාචාරයෙන් තොර බව නිසාය.

iv. දෙමාපියන්ට නොසැළකීම නිසා ය.

10) ගුරු සිසු සබඳතාව දක්වෙන දේශනාවක් වන්නේ,

ii. මහා මංගල සූත්‍රය යි.

iii. සිගාලෝවාද සූත්‍රය යි.

ii. කරණීයමෙත්ත සූත්‍රය යි.

iv. චුල්ල රාහුලෝවාද සූත්‍රය යි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා හොඳින් කියවා නිවැරදි පිළිතුර පහත වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

11) නුවණැති සාත්තු නායක හා අඥාන සාත්තු නායකයන් ගැන කියවෙන ජාතක කථාව....................................................... ජාතකය යි.

**(අපණ්ණක / නලපාන / වණ්ණුපථ)**

12) **"අවි ආයුධවලින් පහර දුන්නොත් මා මරණයට පත් නොකරන ඔවුන් හොඳයයි සිතනවා ස්වාමීනී"** මෙම ප්‍රකාශය කරන ලද්දේ,.......................................................... විසිනි.

**(බුදුරජාණන් වහන්සේ / පුණ්ණහිමි / අස්සජිහිමි)**

13) අස්වැන්න නෙලූපසු එහි අග්‍ර කොටසින් සැදූ දානය හඳුන් වන්නේ........................ ............................... නමිනි. **(අග්‍ර ශෂ්‍යදානය / සාංඝික දානය / ගිරිභණ්ඩ පූජාව)**



LIVEWORKSHEETS

14) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනුවෙන් හඳුන්වන්නේ,....................................... වේ.

**(සතරබිය / සතර බ්‍රහ්ම විහරණ / සතර සංග්‍රහ වස්තු)**

15) රෝග හටගන්නා ක්‍රම අටක් ගැන,........................................................සූත්‍රයේ සඳහන් වේ.

**(කරණීයමෙත්ත / මහා මංගල / ගිරිමානන්ද)**

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල *"අ"* කොටසට අදාළ නිවැරදි පිළිතුර *"ආ"* කොටසෙන් තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

| "අ" කොටස | | "ආ" කොටස |
|---|---|---|
| 16) අකුසලයෙන් වෙන්ව කුසලයෙහි යෙදීම | (..........) | 1. තෙවන සතියේ දී සිදුවිය. |
| 17) රුවන්සක්මන | (..........) | 2. ගැල් ප්‍රධානියා ය. |
| 18) ගුරු සිසු සබඳතාව | (..........) | 3. පාරමිතා ය. |
| 19) සාත්තු නායක | (..........) | 4. විරතිය හා සමාදානය වේ. |
| 20) බුද්ධකාරක ධර්ම | (..........) | 5. දකුණු දිසාවට උපමා කෙරේ. |



LIVEWORKSHEETS